# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ආයතන චක්‍රලේඛ ලිපි අංක : 12/2014**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, සැප්තැම්බර් මස 16 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>විශ්වවිද්‍යාල ක්ෂෙත්‍රයේ පරිපාලනමය නොවන අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා ආරක්ෂිත පාවහන් ලබාදීම</u>

විශ්වවිද්‍යාල සේවකයින් සඳහා ආරක්ෂිත පාවහන් ලබාදීම සම්බන්ධව 2010.09.20 දින නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 929 හි 4 වන පරිච්ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2014.09.01 දින සිට ආරක්ෂිත පාවහන් හිමි සෑම තනතුරක් සඳහාම මාස 18 කට (අවුරුදු 1 ½ කට) වරක් පාවිච්චි කළ පාවහන් යුගල නැවත භාර දීමෙන් පසු නව පාවහන් කට්ටලයක් නිකුත් කිරීමට 2014.08.21 වන දින රැස්වූ 900 වන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

ඉහත වෙනස්වීම හැර කොමිෂන් සභා චක්‍රලේඛ අංක 929 හි විධිවිධාන වල කිසිදු වෙනසක් සිදු නොවේ.

2014.09.01 දින වන විට ආරක්ෂිත පාවහන් යුගලක් ලබා ගෙන හා මාස 18ක් සම්පූර්ණ වී ඇති සේවකයින් වෙතොත්, ඔවුන් නව පාවහන් යුගලක් ලබා ගැනීමට මේ අනුව සුදුසුකම් ලබයි.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම**
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/1/2